# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2024

**6 ශ්‍රේණිය** | **ඉතිහාසය**

නම/ විභාග අංකයඃ ........................................ කාලය ;- පැය 2 යි

**I කොටස**

- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1) දික්සඳ සෙනෙවියා පිරිවෙනේ විසූ මහානාම හිමියන් විසින් රචිත කෘතිය වන්නේ,
   i. දීපවංසය
   ii. මහාවංසය
   iii. දළදාවංසය
   iv. බෝධිවංසය

2) මුස්ලිම්වරුන් තමන්ගේ ආගමික උත්සව පැවැත්වීමේදී කාලය මැනීම සඳහා යොදා ගන්නා ලද වර්ෂ ක්‍රමය වන්නේ,
   i. ක්‍රිස්තු වර්ෂ
   ii. බුද්ධ වර්ෂ
   iii. හිජ්රි වර්ෂ
   iv. ශතවර්ෂ

3) ක්‍රිස්තුවර්ෂ 2024 බුද්ධ වර්ෂයෙන් දැක්වූ විට ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,
   i. 2564
   ii. 2480
   iii. 2024
   iv. 2555

4) පෘථිවි මධ්‍යයේ ඇති උෂ්ණත්ව සෙල්සියස් අංශක
   i. 600
   ii. 6000
   iii. 60
   iv. 60000

5) ගොඩබිම මත මුලින්ම ශාක පැතිර ගිය යුගය හඳුන්වන්නේ,
   i. සිලියුරීන් යුගය
   ii. හෙලොසින යුගය
   iii. ප්ලයිටොසීන යුගය
   iv. පැලියොසොයින යුගය

6) වානර පවුලකින් මානව පරම්පරාවක් බිහිවීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
   i. පෘථිවිය උෂ්ණත්ව වීමෙන් ආහාර හිඟ වීම
   ii. ගිනිකඳු පිපිරීමෙන් ලාවා ගලා යාම
   iii. මහා හිම යුගයේ පැවති දේශගුණික විපර්යාස
   iv. අධික වර්ෂාපතනයක් ඇඳ හැලීම

7) හැකි මිනිසා ලෙස හඳුන්වන්නේ,
   i. හෝමෝ හැබිලිස්
   ii. හෝමෝ සාපියන්ද්
   iii. හෝමෝ ඉරෙක්ටස්
   iv. හෝමෝ නියෙන්ඩතාලෙන්සිස්

8) මිනිසා ගින්දර සොයා ගැනීම නිසා ඇති වූ වාසියක් නොවන්නේ,

i. ශීත කලායේදී උණුස්ම ලබාගත හැකි වීම.

ii. ආහාර පුළුස්සා කෑමට හැකි වීම.

iii. ශරීරයේ හැඩය අලංකාර වීම.

iv. ආහාර දිරවා ගැනීමට අපහසුවීම.

9) පළමුවරට ගින්දර සොයා ගත් බවට තොරතුර ලැබී ඇත්තේ,

i. ඊශ්‍රායලය ii. චීනය

iii. ඉන්දියාව iv. ඊජිප්තුව

10)දුනු - ඊතල භාවිතා කොට දඩයම ආරම්භ වූ කාලය ලෙස සැලකෙන්නේ,

i. පුරා ශිලා යුගය ii. මධ්‍ය ශිලා යුගය

iii. නව ශිලා යුගය iv. ප්ලයිටොසීන යුගය

11)මිනිසා ආගමික කටයුතු වලට නැඹුරු වීම පළමුවරට පෙන්වන යුගය වන්නේ,

i. පුරා ශිලා යුගය ii. මධ්‍ය ශිලා යුගය

iii. නව ශිලා යුගය iv. ප්ලයිටොසීන යුගය

12)මුල් වරට වී වගා කළ රට වන්නේ,

i. ඊශ්‍රාලය ii. මෙක්සිකාව

iii. චීනය iv. මධ්‍යධරණී ප්‍රදේශය

13)මිනිසා තැන තැන ඇවිදීම වෙනුවට ගම්මානවල ජීවත්වීමට පුරුදු වූයේ,

i. ආහාර සොයා යාමට පුරුදු වූ නිසා ii. ගෙවිතැන් කිරීමට හුරු වූ නිසා

iii. දඩයම් කිරීමට පුරුදු වූ නිසා iv. ගින්දර සොයා ගැනීම නිසා

14)අවමංගල චාරිත්‍ර වලදී ඇටසැකිලි වර්ණ ගැන්වීමට බහුලවම ගොදා ගන්නා ලද ගල් වර්ගය වන්නේ,

i. කහඳ ගල් ii. කළු ගල්

iii. තිරිවානා ගල් iv. ගුරු ගල්

15)වෙඩි බෙහෙත්, මාලිමා යන්ත්‍රය මුලින්ම ලෝකයට හඳුන්වාදුන් ශිෂ්ටාචාරය වන්නේ,

i. චීන ශිෂ්ටාචාරය ii. මායා ශිෂ්ටාචාරය

iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය iv. ඊජිප්තු ශිෂ්ටාචාරය

16)මෙසපොතේමියානු වැසියන් අක්ෂර ලිවීමට භාවිතා කළේ,

i. තඩපත් ii. රන් පත්

iii. මැටි පුවරු iv. පොත්පත්

17)ලෝකයට පැරණිතම නීති පොත හඳුන්වා දෙන ලද පාලකයා වන්නේ,

i. ගිල්ගමේෂ් ii. හමුරාබි

iii. අක්හෙනකන් iv. ධොලවීර්

18)ඊජිප්තු වැසියන් ලොවට දායාද කළ විශිෂ්ටතම නිර්මාණය වන්නේ,

i. චිත්‍රාක්ෂර
ii. සිගුරට් දේවාල
iii. මැටිකරත්ත
iv. පිරමීඩ

19)පහත නිර්මාණ අතරින් ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් නිර්මාණයක් වන්නේ,

i. සිගුරට් දේවාලය
ii. නෙෆර්ටිටි රැජිණ
iii. සෙල්ලම් මැටි කරත්ත
iv. කූනාය අක්ෂර

20)අපේ රට ජනාවාස වූයේ අදින වසර

i. එක්ලක්ෂ විසිපන්දාහකට පෙර
ii. එක්ලක්ෂ පනස්දාහකට පෙර
iii. තිස්දාහකට පෙර
iv. දෙදහස් පන්සියයකට පෙර

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- අනෙකුත් ප්‍රශ්න අතරින් ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතුය.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.

1)

A.



i. මෙම රූපයේ දැක්වෙන්නේ කුමක්දැයි සඳහන් කරන්න.
ii. මෙය තැනීමට භාවිතා කර ඇති ද්‍රව්‍ය කුමක්ද?
iii. මෙය භාවිතා කරන ලද මානව වර්ගය නම් කරන්න.
iv. මෙය කුමන කාර්යයන් සඳහා යොදා ගන්නට ඇත්දැයි සඳහන් කරන්න.

$(2 \times 4 = 8)$

B.



i. මෙම රූපය හා සම්බන්ධ රජුගේ නම ලියන්න.
ii. මෙය සෑදීමට භාවිතා කර ඇති ද්‍රව්‍යයෙහි නම ලියන්න.
iii. මෙම රජු අයත් වන රාජවංශයෙහි නම ලියන්න.
iv. මෙම රජු අයත්වන ශිෂ්ටාචාරයෙහි නම ලියන්න.

$(2 \times 4 = 8)$

2)

i. ඉතිහාසය ගැන අපට දැනුම ලබා ගැනීමට උපකාරවන සෑම දෙයක්ම හැඳින්වීමට පොදුවේ යොදන නම කුමක්ද? (ල. 2)
ii. ඉතිහාසය හැදෑරීමට යොදා ගත හැකි පුරාවිද්‍යාත්මක දේවල් හතරක නම් ලියන්න. (ල. 4)
iii. ඉතිහාසය ඉගෙන ගැනීමෙන් ලැබෙන ප්‍රයෝජන කෙටියෙන් සඳහන් කරන්න. (ල. 5)

3)

i. වානර පවුලකට අයත් චිම්පන්සියෙකුගෙන් මිනිසෙකු බිහිවීමේ ක්‍රියාවලිය හඳුන්වන නම ලියන්න. (ල. 2)

ii. හෝමෝ නියෝඩතාලෙන්සිස් සතු වූ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 4)

iii. පුරා ශිලායුගයට අයත් ලක්ෂණ 05ක් ලියන්න. (ල. 5)

4)

i. ඊශ්‍රාලයෙන් සොයාගත් දෑකැත්ත සෑදීමට යොදාගෙන ඇති අමුද්‍රව්‍ය මොනවාදැයි සඳහන් කරන්න. (ල. 2)

ii. මුහුණේ දක්නට ලැබෙන වෙනස්කම් අනුව විවිධ රටවලට පැතිර ගිය හෝමෝ සාපියන්ස් මානව වර්ග දෙකක නම් ලියන්න. (ල. 4)

iii. මිනිසා ගොවිතැනට යොමු වී නිසා ලබාගත් ජයග්‍රහණ 5ක් ලියන්න. (ල. 5)

5)

i. මෙසපොතේමියානු ශිෂ්ටාචාරය පිහිටා තිබෙන ප්‍රදේශය දැන් අයත්වන රටෙහි නම ලියන්න. (ල. 2)

ii. මෙසපොතේමියානු ශිෂ්ටාචාරයේ,

a) පොළොවට අධිපති දෙවියන්ගේ නම ලියන්න.

b) සුළඟට අධිපති දෙවියන්ගේ නම ලියන්න. (ල. 4)

iii. මෙසපොතේමියානු සමාජය පිළිබඳව වාක්‍ය 5ක් ලියන්න. (ල. 5)

6)

i. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ව්‍යාප්තව පැවති ඉන්දු ගංගාව පිහිටා ඇත්තේ ඉන්දියාවේ කුමන ප්‍රදේශයේද? (ල. 2)

ii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත්ව පැවති ප්‍රධාන නගර දෙකක නම් ලියන්න. (ල. 4)

iii.

a) ඉන්දු නිම්න වැසියන් නිවාස ඉදිකිරීමට ගත් අමුද්‍රව්‍ය කුමක්ද?

b) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ වැසියන් භාවිතා කළ ලෝහ වර්ග 2ක් ලියන්න.

c) ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් සොයාගත් පූජකයෙකු බවට සැලකෙන මූර්තියේ දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න. (ල. 5)

7)

i. මුල් ජනාවාස වැසියන් ජීවත් වූ ගල්ගුහා වාසස්ථානයන් පිහිටි ස්ථානයන් නම් කරන්න. (ල. 2)

ii. මුල් ජනාවාස වැසියන් ආහාරයට ගත් ශාකමය ආහාරයක් හා සත්ත්වමය ආහාරයක් නම් කරන්න. (ල. 4)

iii. මුල් ජනාවාසවල වැසියන් අවමංගල කටයුතු සිදු කළ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)